# ශ්‍රී ලංකාවේ ආපදා

## රම්‍ය සිරිවංශ

1990 - 2000 දශකය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ජාත්‍යන්තර ව්‍යසන දශකය ලෙස නමකර තිබුණද, ස්වභාවික ආපදා බහුල වශයෙන් දක්නට ලැබුණේ ඉන් පසුවය. ස්වභාවික ආපදා පිළිබඳව නොයෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් යම් යම් වැඩ පිළිවෙළවල් දියත් කර තිබුණ ද, විධායකය ඇතුළු පාර්ලිමේන්තුව මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකරන ලද්දේ 2004 දෙසැම්බර් 26 වන දින ඇති වූ සුනාමි ව්‍යසනයෙන් පසුවය. මේ නිසාම රජය විසින් 2005 මැයි 13 වන දින අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත සම්මත කර ගන්නා ලදී.

දැනට ආපදා පිළිබඳව කටයුතු කිරීමට ආපදා කළමනාකරණ හා මානව හිමිකම් ආමාත්‍යාංශය නමින් වෙනම් අමාත්‍යාංශයක් පිහිටුවා ඇති අතර, එම අමාත්‍යාංශය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා තිබේ. ඊට අමතරව ආපදාවන්ට ලක්වූවන්ට සහන සැලසීම සඳහා නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය නමින් අමාත්‍යාංශයක් ද වේ.

ව්‍යසන කළමනාකරණ පනතේ ආපදා 19 ක් නම් කර තිබුණ ද ශ්‍රී ලංකාවට අදාළ නාය යෑම්, ගං වතුර, අකුණු ගැසීම, සුනාමි යන ආපදා 4 පිළිබඳ පමණක් මෙහිදී සාකච්ඡා කෙරේ.